සිරිධම්ම විද්‍යාලය
SIRIDHAMMA COLLEGE

# 4 ශ්‍රේණිය - සිංහල - පැවරුම 1

**1. ගල සහ කරත්තකරුවෝ**

1) ඡේද පොතෙන් සොයා කපා අභ්‍යාස පොතේ අලවා ගන්න.
2) ක්‍රියාකාරකම 3 - පියවර 2 සහ පියවර 3 කරන්න. ( ඡේද පොතෙන් කපා අලවා ගන්න)

**2. රෙදි වියනා මකුළු දැරිය**

1) පෙළපොත 6 පාඩම
අවබෝධය, ක්‍රියාකාරකම 1 සහ ක්‍රියාකාරකම 2 කරන්න.

**3. පිට්ටු බම්බුව**

1) දෙබස කියවා ඡේද පොතෙන් කපා අලවා ගන්න.
2) ක්‍රියාකාරකම 4 - පියවර 2 කරන්න.

**4. චරිතාරෝපිතව කතා කිරීම**


1) ක්‍රියාකාරකම 5 - පියවර 1

**5. රූප වලට දෙබස් ලියන්න.**


1) ක්‍රියාකාරකම 6 - පියවර 1 හා පියවර 2 කරන්න. (ඡේද පොතෙන් කපා අලවා ගන්න.)

**6. චිත්‍ර කතා**

1) රස විඳින්න.



2) චිත්‍ර කතාවේ හිස්තැන් සහිත කොටස සම්පූර්ණ කරන්න.



3) චිත්‍ර කතාවට දෙබස් ලියන්න.



## 7. උපදෙස්

විවිධ අවස්ථාවලදී සහ විවිධ ස්ථානවලදී උපදෙස් පිළිපැදීමට සිදුවේ.

1) පුස්තකාලයට, ආගමික ස්ථානයකට සහ වෙනත් පොදු ස්ථානවලට ගිය විට එහි ඇති උපදෙස් කියවා හෝ අසා එම උපදෙස්වලට අනුව කටයුතු කිරීමට සිදුවේ.
   උදා: නිශ්ශබ්ද වන්න, නිකරුණේ කාලය ගත නොකරන්න, වම් පැත්තෙන් ගමන් කරන්න, කුණු තැන තැන දමන්න එපා.

2) පාඩමක් අවසානයේ දී දෙනු ලබන අභ්‍යාසවලට පිළිතුරු ලිවීමේ දී එහි සඳහන් උපදෙස් හොඳින් වටහා ගෙන ඒ අනුව පිළිතුරු ලිවීමට සිදුවේ.
   උදා: වරහන් තුළ ඇති වචනවලින් නිවැරදි වචනය තෝරා හිස්තැනෙහි ලියන්න.

   ශ්‍රී ලංකාව ........................... සාගරයේ පිහිටි කුඩා දිවයිනකි. (ඉන්දියන්, ශාන්තිකර)
   මෙහිදී නිවැරදි පිළිතුර තෝරා හිස්තැනෙහි ලිවිය යුතුය. පිළිතුර යටින් ඉරි ගැසීම සිදු නොකළ යුතු ය.
   ✓ ශ්‍රී ලංකාව ....***ඉන්දියන්***.... සාගරයේ පිහිටි කුඩා දිවයිනකි. (ඉන්දියන්, ශාන්තිකර)
   ✗ ශ්‍රී ලංකාව ........................... සාගරයේ පිහිටි කුඩා දිවයිනකි. (**ඉන්දියන්**, ශාන්තිකර)

3) අභ්‍යාසය : පොදු ස්ථානවල සඳහන් ඔබ දැක ඇති උපදෙස් 5ක් ලියන්න.

## 8. කැලයේ අප සිත් ගත් එක් තැනක් වූයේ...

1) ඡේදය කපා අලවන්න. ඡේදය හොඳින් කියවා ක්‍රියාකාරකම 1 පියවර 2 කරන්න. (නිවැරදිව උපදෙස් පිළිපදිමින් අභ්‍යාසය කරන්න.)

## 9. **ප්‍රවෘත්ති** - ක්‍රියාකාරකම 2 පියවර 1

1) ප්‍රවෘත්තිය හොඳින් කියවා එහි කියවුණු තොරතුරක් ලියන්න.
2) දිනපතා ප්‍රවෘත්ති වලට සවන් දෙන්න. ඇසූ ප්‍රවෘත්තියක් ලියන්න.

## 10. නිවේදන.

1) ක්‍රියාකාරකම 3 පියවර 1 - හතරවන ශ්‍රේණිය සඳහා වාර්ෂිකව... ඡේදය කපා අලවා ගන්න.
   නිවේදනය හොඳින් කියවා ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.
   i. වෛද්‍ය සායනය පැවැත්වෙන්නේ කවදා ද?
   ii. වෛද්‍ය සායනය පැවැත්වෙන්නේ කොහේ ද?
   iii. එදින ඔබ පාසලට රැගෙන ආ යුතු දේවල් මොනවා ද?
   iv. දෙමව්පියන් පාසලට පැමිණිය යුත්තේ කුමන වෙලාවට ද?
   v. වෛද්‍ය සයනයේ දී සිදු කරන්නේ කුමක් ද?

2) පියවර 4 - නිවේදන හොඳින් කියවා පිළිතුරු ලියන්න.
   අප පාසලේ ඩෙංගු මර්දන... (ඡේදය කපා අලවන්න)
   i. නිවේදනය කුමක් සම්බන්ධයෙන් ද?
   ii. දෙමව්පියන් පාසලට පැමිණිය යුත්තේ කීයට ද?
   iii. දෙමව්පියන් පැමිණෙන විට රැගෙන ආ යුතු උපකරණ මොනවා ද?
   iv. පැමිණෙන අයට සංග්‍රහ කරනු ලබන්නේ කවුරුන් ද?
   v. ඩෙංගු මර්දන දිනය යෙදී ඇති දිනය කුමක් ද?

3) වාර්ෂිකව පවත්වන ලබන පාසල් පොළ... (ඡේදය කපා අලවන්න).
   i. පාසල් පොළ පැවැත්වෙන්නේ කවදා ද?
   ii. පොළ ආරම්භ වන වෙලාව ලියන්න.
   iii. සෑම සිසුවෙක්ම රැගෙන ආ යුතු වන්නේ මොනවා ද?
   iv. සිසුනට පැමිණෙන ලෙස දන්වා ඇති වෙලාව ලියන්න.
   v. දෙමව්පියන්ට පැමිණෙන ලෙස දන්වා ඇත්තේ කුමක් සඳහා ද?
4) අප පාසලේ අලුතින් ඉදි කරන පරිගණකාගාරය... (ඡේදය අලවන්න).
   i. උත්සවය පැවැත්වෙන්නේ කවදා ද?
   ii. උත්සවය පැවැත්වෙන වේලාව ලියන්න.
   iii. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වන්නේ කවුද?
   iv. පැමිණීම අනිවාර්ය බව දන්වා ඇත්තේ කවුරුන්ගේ ද?
   v. ළමුන් පෙළ ගැසී සිටිය යුත්තේ ගේට්ටුව අසල සිට කුමන ස්ථානය දක්වා ද?

**11. නුවණැති නායකයා** ( පෙළපොත 9 පාඩම)

1) අවබෝධය, ක්‍රියාකාරකම 1, 2, 3 කරන්න.

**12. තේරවිලි**

1) ටිං ටිං ගාන්නා තෝරා එවන්නේ... ( පෙළපොත 11 පාඩම) අවබෝධය හා ක්‍රියාකාරකම 1 කරන්න.

**13. සමානාර්ථ පද.**

1, 2, 3 ශ්‍රේණිවල දී ඔබ ඉගෙන ගත් සමානාර්ථ පද.

| 1 | | 2 | | 3 | |
|---|---|---|---|---|---|
| | ගස - රුක<br>අම්මා - මව<br>තාත්තා - පියා<br>ඉර - හිරු<br>අහස - ගුවන | | ගෙදර - නිවස<br>ඔළුව - හිස<br>පාර - මාර්ගය<br>තරු - තාරකා<br>පාසල - විදුහල | | ප්‍රවෘත්තිය - පුවත<br>කැලෑව - වනය<br>දූපත - දිවයින<br>රාත්‍රිය - රැය<br>ඇස් - නෙත් |

| 4 ශ්‍රේණියට අදාළ සමානාර්ථ පද | * සියලුම සමානාර්ථ පද අභ්‍යාස පොතේ ලියා පාඩම් කර ගන්න. |
|---|---|
| උදෑසන - හිමිදිරිය<br>කුරුල්ලා - පක්ෂියා<br>පාදය - කකුල<br>වතුර - ජලය<br>පොත - ග්‍රන්ථය | |

1) ක්‍රියාකාරකම 3 - පියවර 2 - ඡේදයේ තිබෙන සමානාර්ථ පද යුගල කොටු කර එක ම වර්ණයකින් පාට කරන්න. (පුංචි තිසර)

   උදා:

| | | |
|---|---|---|
| උදෑසන | හිමිදිරිය | නිල් පාට |
| කුරුල්ලා | පක්ෂියා | රතු පාට |

2) සමානාර්ථ පද යොදා හිස්තැන් පුරවන්න.
   i. **<u>උදෑසන</u>** ම අපේ ඇඟට සිසිලසක් දෙනෙයි.
   ................. අපේ ඇඟට සිසිලසක් දැනෙයි.

ii. අඹ අත්තේ සිටින **කුරුල්ලා** හරි ම ලස්සනයි.
අඹ අත්තේ සිටින ............... හරි ම ලස්සනයි.

iii. ඔහුගේ වම් **කකුල** තුවාල විය.
ඔහුගේ වම් ........... තුවාල විය.

iv. නිරෝගී ජීවිතයකට **වතුර** ප්‍රමාණවත් ව පානය කළ යුතු ය.
නිරෝගී ජීවිතයකට ........... ප්‍රමාණවත් ව පානය කළ යුතු ය.

v. "මඩොල්දූව" මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් රචිත **පොතකි**.
"මඩොල්දූව" මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් රචිත .............. .

## 14. විරුද්ධාර්ථ පද

| ***1*** | ***2*** | ***3*** |
|---|---|---|
| උඩ - යට | යනවා - එනවා | කීකරු - අකීකරු |
| උස - මිටි | ඉහල - පහල | ප්‍රශ්න - පිළිතුරු |
| ලොකු - පොඩි | ඉදිරිපස - පිටුපස | ගැළපෙන -නොගැළපෙන |
| කැමති - අකමැති | පිරිසිදු - අපිරිසිදු | සෙමෙන් - වේගයෙන් |
| මහත - කෙට්ටු | පිපෙනවා - පරවෙනවා | පුරුදු - නුපුරුදු |

1) 4 ශ්‍රේණියට අදළ විරුද්ධාර්ථ පද

| | | |
|---|---|---|
| යහපත් - අයහපත් | ආරම්භය - අවසානය | ලස්සන - අවලස්සන |
| දිරන - නොදිරන | සුදුසු - නුසුදුසු | |

1. ක්‍රියාකාරකම 4 - පියවර 2 – (ශ්‍රමදනය) ඡේදයේ ඇති විරුද්ධාර්ථ පද යුගල කොටු කර එකම වර්ණයකින් පාටකරන්න.
2. විරුද්ධාර්ථ පද යොදු හිස්තැන් පුරවන්න.
   i. **අයහපත්** කාලගුණය නිසා හෙට පාසල් නිවාඩු දිනයක් ලෙස නම් කරයි.
   අපේ ක්‍රීඩා උත්සවය දිනයේ ................... කාලගුණික තත්ත්වයක් පැවතුණි.
   ii. තරගය **ආරම්භයේ** දී ම නිපුන් පසුබට විය.
   තරගය ................... දී රෂීඩ් වේගයෙන් දුව ගියේ ය.
   iii. **කාබනික** පොහොර සැකසීම ට දිරන දේවල් භාවිත කරයි.
   පොලිතීන් ................... ද්‍රව්‍යයකි.
   iv. තැනට **සුදුසු** ඇඳුම් පැළඳුම් ඇඳිය යුතුය.
   ............ වචන කතා නොකරන්න.
   v. ගම මැදින් **ලස්සන** ගංගාවක් ගලා බසී.
   කසල කන්ද ගම .................. කරයි.

## 15. යුගල පද

යුගල පද ලිවීමේදී පද වෙන් කර ලිවිය යුතුය.

| | | |
|---|---|---|
| ***3.*** ගමන් බිමන් | තෑගී බෝග | සිරිත් විරිත් |
| අහල පහල | කෑම බීම | |

ක්‍රියාකාරකම 5 පියවර 2 හි සඳහන් "ඉගෙනීමේ අගය" ඡේදය කියවා 4 ශ්‍රේණියට අදළ යුගල පද හඳුනා ගන්න.

| | | |
|---|---|---|
| ***4.*** ගෙවල් දෙරවල් | යාන වාහන | වතු පිටි |
| කෙලි සෙල්ලම් | පොත් පත් | |

1) ඉහත සියලුම යුගල පද යොදා වාක්‍ය සකස් කරන්න.
2) පියවර 5 හි අභ්‍යාස කරන්න. (ඡේද පොතෙන් කපා ගන්න.)

**16. ප්‍රස්තාව පිරුළු**

1) 3 ශ්‍රේණියේ දී උගත් ප්‍රස්තාව පිරුළු නැවත මතක් කරගන්න.
    i. ළිඳේ ඉන්න ගෙම්බා වගේ - තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැති ව සිටීම.
    ii. ඉදිකටුවයි නූලයි වගේ - සැම විටම තමන් සමග තවත් අයෙක් එකට සිටීම.
    iii. මඩේ හිටවපු ඉන්න වගේ - එක තීරණයක නොසිටීම.
    iv. ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ - කෙනෙකුගෙන් කෙසේවත් ලබාගත නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සාහ දැරීම.
    v. පරංගියා කෝට්ටේ ගියා වගේ - කිට්ටු පාරක් තිබියදී දුර පාරකින් යෑම.
2) පිරුලක මිහිර - (පෙළපොත 12 පාඩම)
    i. පාඩම කියවා ප්‍රස්තාව පිරුළු හඳුනා ගන්න. අවබෝධය සහ ක්‍රියාකාරකම 1 කරන්න.
3) ඡේද පොතේ ක්‍රියාකාරකම 6 පියවර 5 අභ්‍යාසය කරන්න.

4) 4 ශ්‍රේණියට අදළ ප්‍රස්තාව පිරුළු
    i. කළුවා මාරපන් ගියා වගේ - විමසීමකින් තොරව යමක් කිරීම.
    ii. ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ - අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම.
    iii. කටුස්සාගේ කරේ රත්තරන් බැන්ද වගේ - නුසුදුස්සාට තනතුරු දීමෙන් අහංකාර වීම.
    iv. ඉඟුරු දීලා මිරිස් ගත්තා වගේ - යම් කරදරයකින් මිදීමට කරන ක්‍රියාවෙන් වඩාත් කරදරයකට පත් වීම.
    v. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ - තීරණ ගැනීමේදී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණ ගැනීම.
5) ඉහත ප්‍රස්තාව පිරුළු නිවැරදිව ලියන ආකාරයත්, ඒවායේ අර්ථයත් හොඳින් ඉගෙන ගන්න.

**17. ඉඟි වැකි**

1) ඉඟි වැකියක් මගින් ප්‍රකාශ කිරීමට යන අදහස වඩා පැහැදිලි වත්, රසවත් ලෙසත් ඉදිරිපත් කළ හැකි ය. ඉඟි වැකියක වචනයේ මතුපිට අර්ථයට වඩා ඉක්මවා යන අර්ථයක් තිබේ.
    i. එක හුස්මට - යම් කිසි කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරීම.
    ii. අකුරක් නෑර - කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීම.
    iii. ඉහේ මලක් පිපුණා - දැඩි සතුටකට පත් වීම.
    iv. අනූ නවයෙන් බේරුණා - යම් විපතකින් යන්තමින් ගැළවීම.
    v. මොර සූරන වැස්ස - අධික වර්ෂාව.

2) ක්‍රියාකාරකම 6 පියවර 3 කරන්න. (ඡේද පොතෙන් කපා ගන්න.)
3) සවනිගේ දින පොතෙන් (පෙළ පොත 10 පාඩම) අවබෝධය, ක්‍රියාකාරකම 1 සහ 2 කරන්න.

**18. රබන් පද**

1) රබන් වයමු ද්‌ෙං තා (පෙළපොත 14 පාඩම)
    i. රබන් පද ගායනා කරන්න. අවබෝධය සහ ක්‍රියාකාරකම 2 කරන්න.
    ii. ක්‍රියාකාරකම 1 පියවර 8 කරන්න. (ඡේද පොතෙන් කපා ගන්න)

## 19. සුබ පැතුම් පත්

1) සුබ පැතුම් පතක අඩංගු විය යුතු කරුණු.
    i. සුබ පැතුම් පත කුමක් සඳහා ද?
    ii. එය ලියා ඇත්තේ කවරෙක් ද?
    iii. කවුරුන් සඳහා ද?
    iv. සුබ පැතුමෙහි විස්තරය.




2) අපතේ යන ද්‍රව්‍ය භාවිත කරමින් සහෝදරයෙකු/ නැදෑයකු විභාගයකට පෙනී සිටීමට සූදනම් වන විට යැවිය හැකි සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

## 20. වගුගත කිරීම්

1) වර්ග අනුව යමක් වෙන් කර ගැනීමේදී වගුවක් භාවිත කළ හැක.
    i. පහත වගු පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න.

| එළවළු | පලතුරු |
|---|---|
| වම්බටු | අඹ |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |

| කුරුල්ලන් | සිවුපා සතුන් |
|---|---|
| ගිරවා | බල්ලා |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |

| ඖෂධ | ධාන්‍ය |
|---|---|
| කොහොඹ | කඩල |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |

| මල් වර්ග | ගස් වර්ග |
|---|---|
| අරලිය | කොස් |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |

***<u>දෙමාපියන් සඳහා උපදෙස්</u>***

*ඉහත අභ්‍යාස කිරීමට දරුවාට ඔබගේ උදව් ලබා දෙන්න. සිංහල ලිවීම පොත අභ්‍යාස කිරීම සඳහා භාවිතා කරන්න. දිනකට එක ක්‍රියාකාරකම බැගින් පැවරුම සම්පූර්ණ කරන්න. ඉහත පැවරුම සම්බන්ධ ගැටලුවක් ඇති වුවහොත් අමතන්න - 077 920 7878 (නදීකා ගුරුතුමිය)*